**මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානයේ පැවැති රු.871,032ක ගබඩා තොගය, රු. 52,170ක කාබනික පොහොර තොගය සහ රු.802,360ක ආයුර්වේද තොගය ගිණුම්ගත කර නොතිබුණි. | ගබඩා තොගය, කාබනික පොහොර තොගය සහ ආයුර්වේද අතැති භාණ්ඩ ශේෂය ආදියෙහි වටිනාකම් තොග ගිණුම්වල දැක්වීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වසර අවසානයේ තොග ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගෙවූ රු. 2,167,547ක JCB යන්ත්‍රයේ ණය වාරික, ණය ගිණුම හර කිරීම වෙනුවට වත්කම් ගිණුම හර කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ගෙවූ JCB වාහන ණය වාරික දෝෂයකින් පිරියත හා යන්ත්‍රෝපකරණ ගිණුමේ නැවතත් ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ නැගෙනහිර පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රදාන මගින් මිලදීගත් රු.150,000ක් වටිනා පොත් 444ක් සහ පරිත්‍යාග ලද රු.100,000ක පොත් 417ක් 'පොත් ගිණුමේ' වත්කම් ලෙස අනාවරණය කර නොතිබුණි. | මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | පොත් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු. 175,000ක සුළං පීඩන යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කර තිබුණි. | මිලදී ගත් රු. 175,000ක සුළං පීඩන යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම් වටිනාකම් ගිණුම්වල අනාවරණය කළ යුතුය. |
| (ඉ) | සේවක ණය ලේඛනය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු. 11,210, 581ක් වුවත් | සේවක ණය ලේඛනය සහ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම අතර වෙනස නිවැරදි | විචලනයන් හඳුනාගෙන ගිණුම්වල නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල රු. 12,646,822ක් ලෙස අනාවරණය කර නොතිබුණි. | කිරීමට පියවර ගනු ලැබේ. | |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 31,068,561 ක් වූ ස්ථාවර ශේෂ 18 කට අදාල හිමිකම් සඳහා ස්ථාවර වත්කම් ලේඛන සහ අයිතිය සනාථ කිරීමේ ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන ඉදිරිපත් නොකෙරුණි. | ඉඩම් හා ගොඩනැගිලි, පිරියත, මෝටර් රථ හා වාහන සහ ලීබඩු වැනි ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරු කිරිමටත් වාහනවල හිමිකාරිත්වය මාරුකිරීමටත් පියවර ගෙන ඇත. | වත්කම්වල ලිඛිත සාක්ෂි ලබාගැනීමටත්, ලේඛනවල ලේඛනගත කිරීමටත් පියවර ගත යුතුය. |

## 1.7 අනුකුල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(1) සහ (2) | වර්ෂ දෙකක් ඉක්ම වූ කල් ඉකුත් වූ රු. 592,964 ක් වටිනා තැන්පතු 45ක් සභාව අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරිමට හෝ කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරිමට කටයුතු කරනු ලැබේ. | තැන්පතු මුදල් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරිමට හෝ කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,125,623 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,641,604ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.2,504,300ක හිඟ වරිපනම් බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි වටිනාකම වැඩවී තිබෙන අතර වර්තමානයේ අයකිරීමට පියවර ගෙන ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | 1991 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාල රු. 2,779,175ක කඩකාමර හිඟකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔබ විසින් අනාවරණය කර තිබූ කඩකාමර කුලී අයකර ගැනීමට වර්තමානයේ පියවර ගෙන ඇත. | හිඟ කඩකුලී අයකර ගැනීමට අප්‍රමාදව පියවර ගත යුතුය. |
| (ඇ) | 1985 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාල වෙළෙඳපොල හිඟ බදුකුලී රු. 18,605,427 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ තීරණය කර කපාහැරීම සම්බන්ධයෙන් පළාත්පාලන කොමසාරිස් වරයාගේ උපදෙස් ලබාගෙන කටයුතු කිරිමට නියමිතය. | හිඟහිටි වෙළෙඳපොල බදුකුලී අයකිරීමට හෝ සුදුසු පරිදි ක්‍රියාමර්ග ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලා ප්‍රකාශනවල ණය බැරකමක් ලෙස දක්වා තිබූ රු. 406,537ක විවිධ ණයහිමියෝ සහ රු.2,069,410ක විදුලිය බෙදාහැරීමේ ණය මුදල් නිරවුල් කර නොතිබුණි. | ණය බැරකම් රු.406,537ක විවිධ ණයහිමියෝ සහ රු.2,069,410ක විදුලිය බෙදාහැරීමේ ණය මුදල් ගෙවීමට පියවර ගනු ලැබේ. | ණය මුදල් නිරවුල් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා පරිපාලන බලප්‍රදේශය තුළ ඉදිකළ පෞද්ගලික උත්සව ශාලාවක් සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 17 දිනැති අංක 597/8 දරන අතිශේෂ ගැසට්පත්‍රයේ පල කළ නාගරික සංවර්ධන අධිකාරියේ රීති මාලාවේ උප වගන්ති 6(11), (111) ප්‍රකාරව, ගොඩනැගිලි අනුමැතිය සඳහා රු.1,004,100ක දඩගාස්තු අයකළ යුතු වුවත්, රීති මාලාව නොසලකා දඩගාස්තු ලෙස රු.64,120ක් පමණක් අයකර තිබුණි. | ඉදිරිකාලයේදි නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ. | පනතේ රීති ප්‍රකාරව දඩ ගාස්තු අයකිරීමට පියවර ගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**-------------------------------------------**

**විගණන හා කළමනාකරණ කමිටු**

**-------------------------------------**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | රටෙහි පැවැති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රැස්වීම් පැවැත්වීම වැලැක්වීමේ තත්ත්වය මත රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |